
# ඉතිහාසය

# 6 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2015 සිට ක්‍රියාත්මක වේ)



සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# ඉතිහාසය

## ගුරු මාර්ගෝපදේශය

# 6 වන ශ්‍රේණිය

**(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk  විද්‍යුත් තැපැල : info@nie.lk

**ඉතිහාසය**
**6 වන ශ්‍රේණිය**
**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2014**

© **ජාතික අධ්‍යාපන ආයතනය**

ISBN ..............

**සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info@nie.lk

**මුද්‍රණය :** **මුද්‍රණාලය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**
**ශ්‍රී ලංකාව**

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවයෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රම වේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයෙහි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙ හි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාට ද දෙගුරුනට ද භාවිත කළ හැකිය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | |
| ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| **විෂය විශේෂඥ සහය** | |
| මහාචාර්ය ඉන්ද්‍රාණි මුණසිංහ | කොළඹ විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය රාජ් සෝමදේව | කැලණිය විශ්ව විද්‍යාලය (පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය) |
| මහාචාර්ය පත්මසිරි කන්නන්ගර | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| **ලේඛක මණ්ඩලය (බාහිර)** | |
| ඩී.ඒ.ඒ. සිරිසේන | ගුරු උපදේශක,<br>කලාප අධ්‍යාපන කාර්යාලය, තඹුත්තේගම |
| එන්. කමර්දීන් | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය, කැකිරාව |
| කේ.එස්. රංජනී | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ |
| ඩබ්ලිව්.ඒ. පියසීලි | ගුරු සේවය<br>ශ්‍රී රාහුල මධ්‍ය මහා විද්‍යාලය, අලව්ව |
| ඒ. ඉන්ද්‍රානි | ගුරු සේවය<br>ජේසු බිළින්දාගේ කන්‍යාරාම ජාතික පාසල, රත්නපුර |
| එච්.එම්. නලින් බණ්ඩාර | ගුරු සේවය<br>කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය, කුරුවිට |
| **ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර)** | |
| ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| ඩබ්ලිව්.එස්.එස්. ගුණවර්ධන | සහකාර කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

2007 වර්ෂයේ සිට පාසල් විෂය මාලාවේ හර විෂයක් ලෙස ක්‍රියාත්මක වූ ඉතිහාසය 2015 වර්ෂයේ සිට එලෙස ම ක්‍රියාත්මක වන අතර 6 - 9 ශ්‍රේණි සඳහා සතියකට කාල පරිච්ඡේද දෙකක් හා 10 - 11 ශ්‍රේණි සඳහා සතියකට කාලපරිච්ඡේද තුනක් වෙන්කර ඇත.

අ.පො.ස.(සා.පෙළ) විභාගයට 10 - 11 ශ්‍රේණි සඳහා නියමිත විෂය නිර්දේශ පදනම් කරගෙන ඇගයීම සිදු කිරීමට යෝජිතය.

6 - 11 ශ්‍රේණි සඳහා නිපුණතා පාදක ප්‍රවේශයට ප්‍රධාන නිපුණතා විස්සක් යටතේ ඉතිහාසය විෂයමාලාව ගොඩනගා ඇත. එම විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට සකසා ඇති මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශය හා විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට මගපෙන්වීම යන කොටස් දෙකකින් සමන්විත ය.

ඉතිහාසය විෂය තුළින් සිසුන් තුළ ප්‍රගුණ කිරීමට අපේක්ෂිත නිපුණතා සංවර්ධනය කිරීමේ දී විෂය කරුණු මෙන් ම විෂය කරුණු අධ්‍යයනය කිරීමට යොදාගන්නා ක්‍රමවේදයන් ද වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගුරු කාර්ය පහසු කර ගැනීම සඳහා විෂය අන්තර්ගතයෙහි ඇතැම් කොටස් ආවරණය වන පරිදි නිදර්ශක ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් කර ඇත. ඔබගේ නිර්මාණශීලී හැකියාවන් ප්‍රයෝජනයට ගනිමින් පන්ති කාමර අවශ්‍යතාවන් අනුව මෙම ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කිරීම හා නව ක්‍රියාකාරකම් සැකසීමට හැකිය. මෙහි දී සැලකිලිමත් විය යුත්තේ ඉතිහාසය විෂයේ අරමුණු ඉටුවන පරිදි අවම වශයෙන් 50%ක් වත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරමින් නියමිත විෂය කරුණු අධ්‍යයනයට සිසුන් යොමු කිරීමයි.

ඊට අමතර ව පන්තිකාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පහසුකම් සපයන විස්තර හා තොරතුරු ඇතුළත් **වීඩියෝ** පට සකසා ඇති අතර, ඒ ඒ ඒකක යටතේ ඒ පිළිබඳ තොරතුරු සඳහන් කර ඇත.

ඒ අනුව ඉතිහාසය විෂයේ අරමුණු ඉටුකරමින් නිපුණතා සපිරි නව ලොවකට උචිත සිසු පිරිසක් බිහිකිරීමට අත්වැලක් සැපයීම මෙම ගුරු මාර්ගෝපදේශයෙන් අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන් ඔබගේ සංවර්ධනාත්මක අදහස් හා යෝජනා අපවෙත යොමුකරන මෙන් ද කාරුණික ව ඉල්ලා සිටිමු.

**විෂයමාලා කමිටුව**

# පටුන

පිටුව


| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | | iv |
| විෂයමාලා කමිටුව | | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | | vi |
| විෂය නිර්දේශය අන්තර්ගතය | | viii-xx |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | | 01 - 36 |
| 6.1 | ඉතිහාසය හැඳින්වීම | 01 - 04 |
| 6.2 | ආදි මිනිසා | 05 - 14 |
| 6.3 | ලෝකයේ පැරණි ශිෂ්ටාචාර | 15 - 19 |
| 6.4 | ශ්‍රී ලංකාව ජනාවාස වීම | 20 - 22 |
| 6.5 | අපේ කීර්තිමත් රජවරු | 23 - 36 |


-

# ඉතිහාසය

## විෂය නිර්දේශය

## 6 ශ්‍රේණිය

**(2015 සිට ක්‍රියාත්මක වේ)**


සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

## හැඳින්වීම

තම රටේ අනන්‍යතාව හඳුනාගනිමින් , ඒවා රැකගනිමින් ලෝක තත්ත්වයන්ට මුහුණ දිය හැකි දැ හිතකාමී, ශක්තිමත් ශ්‍රී ලාංකික පුරවැසියකු බිහිකර ගැනීමේ අරමුණු පෙරදැරි කර ගෙන පාසල් විෂයමාලාවේ හර විෂයක් ලෙස ඉතිහාසය විෂය 2007 වසරේ සිට ක්‍රියාත්මක වේ.

මෙම අරමුණු වඩාත් පෝෂණය කරමින් 2015 වසරේ දී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ජාතික පොදු අරමුණු සහ ජාතික පොදු නිපුණතා ද පාදක කර ගනිමින් ඉතිහාසය විෂයට අදාළ ව නිපුණතා විස්සක් යටතේ 6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා ඉතිහාසය විෂයමාලාව නිපුණතා පාදක ක්‍රමවේදය යටතේ සකස් කර ඇත.

6 වන ශ්‍රේණිය සඳහා වූ මෙම විෂය නිර්දේශය එහි ප්‍රතිඵලයකි. 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මකවීමට නියමිත මෙහි නිපුණතා තුනක් යටතේ විෂය අන්තර්ගතය ගොඩනගා ඇත. මානව ශිෂ්ටාචාරයේ ප්‍රභවය හා පසුබිම, ශ්‍රී ලංකාවේ ජනාවාස සහ අනුරාධපුර රාජධානි සමය ද ඇතුළත් තේමා පහක් අධ්‍යයනය සඳහා ඉදිරිපත් කර ඇත.

ඤ·

.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කර ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දූර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

I වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

x III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

ix.

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා :
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(iii) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## ඉතිහාසය විෂයයේ අරමුණු

6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා වූ විෂයමාලාව අධ්‍යයනය කිරීමෙන් පහත සඳහන් අරමුණු සිසුන් සාධනය කර ගනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

1. ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් ඉතිහාසය පුරා සිදු වූ වෙනස්කම් පිළිබඳ වටහා ගැනීම
2. අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය තුළින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම
3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමයන් සුරකිමින් දැහිතකාමී පුරවැසියකු බවට පත්වීම
4. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම
5. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරිම
6. කාලානුපිළිවෙල, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කිරීම
7. වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම
8. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම
9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම
10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීම

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **ඉතිහාසය ගොඩනැගීමට උපකාරී වන මූලාශ්‍රය අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කර ගනියි** | 1.1 **ඉතිහාසය යනු අතීතයේ සිට වර්තමානය දක්වා මිනිසාගේ කතන්දරය බව පෙන්වා දෙයි** | **1. ඉතිහාසය හැඳින්වීම**<br>1.1 මිනිසාගේ අතීත කතාව | • ඉතිහාසය යනු කුමක්දැයි පැහැදිලි කරයි<br>• ඉතිහාසයෙන් ප්‍රකාශ වන්නේ මිනිසාගේ අතීතය බව විස්තර කරයි | **04** |
| | 1.2 **මිනිසා පරිහරණය කළ දෑ තුළින් ඉතිහාසය ගොඩනගයි** | 1.2.1 මිනිසාගේ අතීත කථාව ගොඩනගා ගන්නා ආකාරය<br>1.2.2 කාලය මැන ගැනීම | • මූලාශ්‍රය හඳුන්වයි<br>• මූලාශ්‍රය ඇසුරින් ඉතිහාසය පැහැදිලි කරයි<br>• විවිධ ක්‍රම මගින් කාලය මනියි | |
| මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි | 2.1 **පාරිසරික සාධක මත ජීවීන්ගේ ආරම්භය සහ මානවයා බිහිවීම විස්තර කරයි** | **2. ආදි මිනිසා**<br>2.1 මිනිසා බිහි වූ පරිසරය<br>• පෘථිවිය බිහි වී ඉතා දීර්ග කාලයකට පසු මිනිසා බිහිවීම<br>• මිනිසා බිහි වීමට පෙර ජලයෙ හි හා ගොඩබිම විසූ විවිධ සතුන් (පින්තූර මගින්)<br>• එම සතුන් විසූ යුග<br>• මිනිසා බිහිවීමට බලපෑ පරිසරයේ ස්වභාවය (පින්තූර මගින් ) | • පෘථිවියේ උපතට පසු දිගු කලක් ගත වී මිනිසා බිහි වූ බව පැහැදිලි කරයි<br>• මිනිසා බිහිවීමට පෙර පැළෑටි හා සතුන් බිහි වූ බව විස්තර කරයි<br>• මිනිසා බිහි වූ පරිසරය පැහැදිලි කරයි | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 දේහ ලක්ෂණ වෙනස් වෙමින් මානව පරිණාමය සිදු වූ ආකාරය පෙන්වා දෙයි | 2.2දේහ ලක්ෂණ අනුව මිනිසාගේ විකාශනය (ජීවීන්ගේ ආරම්භය, ප්‍රාථමික මිනිසාගේ සිට නූතන මිනිසාගේ බිහිවීම දක්වා-පින්තූර මගින්) | • මානව පරිණාමය විස්තර කරයි<br>• මානව පරිණාමයට හේතු දක්වයි<br>• නූතන මිනිසාගේ බිහිවීම දිගු කාලීන ක්‍රියාවලියක් බව පෙන්වා දෙයි | |
| | 2.3 ස්වභාවික පරිසරයට අනුවර්තනය වීමේ දී දේහ ලක්ෂණ වෙනස්වන ආකාරය නූතන මිනිසා ඇසුරින් පැහැදිලි කරයි | 2.3නූතන මිනිසා (භූගෝලීය සාධක අනුව මිනිසාගේ වෙනස් වීම-පින්තූර මගින්) | • විවිධ පරිසර තත්ත්ව විස්තර කරයි<br>• විවිධ පරිසර තත්ත්ව අනුව නූතන මිනිසාගේ දේහ ලක්ෂණ වෙනස් වන ආකාරය පැහැදිලි කරයි | |
| | 2.4 ආදී මිනිසා මුහුණ පෑ අභියෝග ජය ගත් ආකාරය විමසා බලා වර්තමානය සමඟ සසඳමින් අනාගත අභියෝගවලට මුහුණ දීමේ කුසලතාව වර්ධනය කර ගනියි | 2.4 මිනිසාගේ සංස්කෘතික පරිණාමය<br>• ආදි මිනිසා මුහුණ දුන් අභියෝග<br>• අභියෝගවලට මුහුණ දුන් ආකාරය | • ආදි මිනිසා මුහුණ දුන් අභියෝග පෙන්වා දෙයි<br>• අභියෝග ජයගත් ආකාරය පැහැදිලි කරයි<br>• අතීත ආදර්ශ අනුව වර්තමාන අභියෝග ද ජයගත හැකි ආකාරය පෙන්වා දෙයි | |
| මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි | 3.1 ලෝකයේ පැරණි ශිෂ්ටාචාර පැහැදිලි කරයි | 3. ලෝකයේ පැරණි ශිෂ්ටාචාර<br>3.1.1 ශිෂ්ටාචාරය හැඳින්වීම<br>• ලෝකයේ පැරණි ශිෂ්ටාචාර ඇසුරින් | • ශිෂ්ටාචාරයක් යනු කුමක්දැයි විස්තර කරයි<br>• ශිෂ්ටාචාරයක මූලික ලක්ෂණ පැහැදිලි කරයි | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 ලෝකයේ පැරණි ශිෂ්ටාචාර සහ ඒවායේ භූගෝලීය ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි | 3.2 ලෝකයේ පැරණි ශිෂ්ටාචාර<br>• භූගෝලීය පිහිටීම,කාල වකවානු | • ලෝකයේ පැරණි ශිෂ්ටාචාර නම් කරයි<br>• ශිෂ්ටාචාර පිහිටීම සිතියමක ලකුණු කරයි<br>• ශිෂ්ටාචාර පිහිටි ස්ථාන පැහැදිලි කරයි | |
| | 3.3 පැරණි ශිෂ්ටාචාරවල දියුණුව ඇසුරින් වර්තමානයට ලබා ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි | 3.3 පැරණි ශිෂ්ටාචාරවලින් ලෝකයට උරුම වු දායාද | • පැරණි ශිෂ්ටාචාරවල දියුණුව පෙන්වා දෙයි<br>• ශිෂ්ටාචාරවල පෞරාණික බවට කරුණු දක්වයි<br>• පැරණි ශිෂ්ටාචාරවලින් වර්තමානයට ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි | |
| මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි | 4.1 ශ්‍රී ලංකාවේ මුල් ජනාවාසවල ව්‍යාප්තිය සහ එහි කාල අවකාශීය විවිධත්වය පහදයි | **4. ශ්‍රී ලංකාව ජනාවාස වීම**<br>4.1 මුල් ජනාවාස<br>• මුල් ජනාවාසවල ව්‍යාප්තිය<br>• මුල් ජනාවාසවල මූලික ලක්ෂණ<br>• දියුණු ජන සමාජයක් පැවතීම (පින්තූර මගින්)<br>• නගර බිහිවීම | • ජනාවාස ව්‍යාප්ත වූ ප්‍රදේශ පෙන්වා දෙයි<br>• මුල් ජනාවාසවල ස්වරූපය හඳුන්වයි<br>• ආදි මානවයා මෙරට විවිධ පරිසර කලාපවලටඅනුවර්තනය වෙමින් ජීවත් වූ බව පහදයි | 09 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| අතීත ශ්‍රී ලාංකික රජවරුන්ගේ චරිතාපදාන හා ජාතික සේවාව අගයමින් ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය විමසා බලයි | 5.1.1 පණ්ඩුකාභය කුමරු අභියෝග ජය ගනිමින් රාජ්‍යත්වයට පත් වූ ආකාරය විමසා බලයි | 5 අපේ කීර්තිමත් රජවරු 1<br>5.1 පණ්ඩුකාභය රජතුමා<br>5.1.1 ළමා කාලය | • පණ්ඩුකාභය රජතුමාගේ ළමා කාලය පිළිබඳ තොරතුරු විස්තර කරයි<br>• පණ්ඩුකාභය කුමරුට පැමිණි අභියෝග පැහැදිලි කරයි<br>• අභියෝග ජය ගැනීමට පණ්ඩුකාභය චරිතයෙන් ගත හැකි ආදර්ශ විස්තර කරයි | 03 |
| | 5.1.2 පණ්ඩුකාභය රජතුමාගේ කාර්ය සාපල්‍යයතාව විමසා බලයි | 5.1.2 රාජ්‍යත්වයට පත්වීම<br>පාලනය | • පණ්ඩුකාභය රජතුමා රාජ්‍යත්වයට පත් වු ආකාරය පහදයි<br>• පණ්ඩුකාභය රජුගේ රාජ්‍ය පාලනය විස්තර කරයි<br>• පණ්ඩුකාභය රජුගේ ශ්‍රේෂ්ඨත්වය විස්තර කරයි | |
| | 5.2.1 ශ්‍රී ලංකාවට බුදුදහම ගෙන ඒම හා එය ස්ථාපිත කිරීමෙහි ලා දේවානම්පියතිස්ස රජතුමාගේ සේවය මතුකර දක්වයි | 5.2 දේවානම්පියතිස්ස රජතුමා<br>5.2.1 ලංකාවට බුදු දහම ගෙන ඒම<br>• බුද්ධ සාසනය ස්ථාපිත කරවීම | • ලංකාවට බුදු දහම ලැබුණු අයුරු විස්තර කරයි<br>• බුද්ධ සාසනය ලංකාවේ ස්ථාපිත වූ අයුරු විස්තර කරයි<br>• දේවානම්පියතිස්ස රජතුමාගේ සේවාව පැහැදිලි කරයි | 04 |
| | 5.2.2 සදාචාරවත් සමාජයක් ගොඩ නැගීමට බුදු දහමින් ලද ආභාසය ඇසුරින් යහපත් ගුණාංග වර්ධනය කර ගනියි | 5.2.2 බුදු දහමින් ලද දායාද | • බුදු දහමින් ලද දායාද විස්තර කරයි<br>• සදාචාරවත් ජන සමාජයක් ගොඩනැගුණු අයුරු පැහැදිලි කරයි<br>• වර්තමාන යහපත් ජනසමාජයක් සඳහා යොදාගත හැකි අතීත ආදර්ශ පෙන්වා දෙයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.3.1 දුටුගැමුණු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය පෙන්වා දෙයි | 5.3 දුටුගැමුණු රජතුමා<br>5.3.1 ළමා කාලය<br>• එළාර රජතුමා<br>• කාවන්තිස්ස රජුගේ සේවය<br>• දුටුගැමුණු රජතුමා රට එක්සේසත් කිරීම | • එළාර යහපත් රජතුමකු බව පෙන්වා දෙයි<br>• කාවන්තිස්ස රජුතුමාගේ ක්‍රියාකලාප විස්තර කරයි<br>• දුටුගැමුණු රජුතුමාගේ ශ්‍රේෂ්ඨත්වය පැහැදිලි කරයි | 05 |
| | 5.3.2 දුටුගැමුණු රජතුමාගෙන් ඉටු වූ සාසනික සේවය අගයමින් යහපත් ගුණාංග චරිතායනය කර ගනියි | 5.3.2 වෙහෙර විහාර කරවීම | • දුටුගැමුණු රජතුමාගෙන් ඉටු වූ සාසනික සේවය විස්තර කරයි<br>• වර්තමාන යහපත් ජන සමාජයක් සඳහා යොදා ගත හැකි අතීත ආදර්ශ පෙන්වා දෙයි | |
| | 5.4 වළගම්බා රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය අගයමින් එහි ආදර්ශ චරිතායනය කර ගනියි | 5.4 වළගම්බා රජතුමා<br>• රාජ්‍යත්වයට පත්වීම<br>• අභයගිරිය කරවීම<br>• ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම | • වළගම්බා රජතුමා රාජ්‍යත්වයට පත් වු ආකාරය පැහැදිලි කරයි<br>• වළගම්බා රජුතුමාගේ සාසනික සේවාව විස්තර කරයි<br>• වළගම්බා චරිතයෙන් ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.5 වසභ රජතුමාගේ කාර්ය සාපල්‍යයතාව විස්තර කරයි | 5.5 වසභ රජතුමා<br>• රාජ්‍යත්වට පත්වීම<br>• ආර්ථික සේවය<br>* මහ වැව් කරවීම | • වසභ රජතුමා රාජ්‍යත්වයට පත් වූ අයුරු පෙන්වා දෙයි<br>• වසභ රජතුමාගේ පාලනය විස්තර කරයි<br>• ආර්ථික සේවාව පැහැදිලි කරයි | 03 |
| | 5.6 මහසෙන් රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය මතු කර දක්වයි | 5.6 මහසෙන් රජතුමා<br>• ආර්ථික සේවය<br>* මහා පරිමාණ වැව් ඉදිකිරීම<br>• ජේතවනාරාමය කරවීම | • මහසෙන් රජතුමාගේ වාරි සේවාව විස්තර කරයි<br>• මහසෙන් රජතුමාගේ ඉදිකිරීම් ශිල්පීය දක්ෂතාව පෙන්වා දෙයි<br>• මහසෙන් රජතුමාගේ ආගමික සේවාව පැහැදිලි කරයි | 03 |
| | 5.7 ධාතුසේන රජතුමා ඉටු කළ මෙහෙය විස්තර කරයි | 5.7 ධාතුසේන රජතුමා<br>• රාජ්‍යත්වයට පත්වීම<br>• ආර්ථික සේවය<br>* වාරි කර්මාන්තය සඳහා දායකත්වය<br>• අවුකන පිළිමය කරවීම | • ධාතුසේන රජතුමා රාජ්‍යත්වයට පත් වූ ආකාරය පැහැදිලි කරයි<br>• ධාතුසේන රාජ්‍ය සමයේ පැවති ආර්ථික කටයුතු විස්තර කරයි<br>• ධාතුසේන රජතුමාගේ ආගමික සේවාව පහදයි | 03 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 6.1 ඉතිහාසය හැඳින්වීම

ඉතිහාසය යනු කුමක් ද? එය ගොඩනගන්නේ කෙසේද? ඉතිහාසයට අයත් දීර්ඝ කාලය මැනගන්නේ කෙසේද? යන කරුණු මෙම ඒකකය මගින් අවධානයට ගෙන ඇත.

**නිපුණතාව**

- ඉතිහාසය ගොඩනැගීමට උපකාරීවන මූලාශ්‍රය අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණුකර ගනියි

**නිපුණතා මට්ටම**

6.1 ඉතිහාසය යනු අතීතයේ සිට වර්තමානය දක්වා මිනිසාගේ කථාන්තරය බව පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාවː 02**

**ඉගෙනුම් පල**

- ඉතිහාසය යනු කුමක්දැයි පැහැදිල කරයි
- ඉතිහාසයෙන් ප්‍රකාශවන්නේ මිනිසාගේ අතීතය බව විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න.

1.1 මිනිසාගේ අතීත කතාව

- ඉතිහාසය යනු අතීත කාලයේ සිට ජීවත් වූ මිනිසුන් පිළිබඳ කථාව බව පැහැදිලි කිරීම
- අතීතය යනු ගෙවී ගිය කාලය බවත්, එය මිනිසා පෘථිවියේ බිහිවීමේ සිට ගත වූ පසුගිය දින දක්වාත් කාලපරාසය බවත් අවබෝධ කරවීම
    - මෙම කාලය තුළ මිනිසා සිය සමාජ අවශ්‍යතා සපුරා ගැනීමට දැරූ උත්සාහයට සමාන්තර ව ඉතිහාසය ගොඩනැගෙන ඇයුරු පෙන්වා දීම
    - වර්තමාන සෑම දෙයකට ම අතීතයක් ඇති බව
    - ඉතිහාසය නිර්මාණය කරන්නේ මිනිසා විසින් බව පැහැදිලි කිරීම

    ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි ඉතිහාසය යනු කුමක් ද? යන්න අවබෝධ කර ගැනීම සඳහා පාසලේ ඉතිහාසය පිළිබඳ රචනාවක් ලිවීම මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න

    - ⋆ පාසල ආරම්භ කිරීමට හේතු, මුල් වූවෝ, මුල් ම ගුරුවරුන් හා සිසුන්, පාසලේ සංවර්ධනය
    - ⋆ මුල් ගොඩනැගිලි, දායක වූවෝ ආදී පින්තූර තිබේ නම් එකතු කිරීමට අවස්ථාව ලබා දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

- පාසල් ඉතිහාසය සෙවීම සඳහා අවශ්‍ය වන මූලාශ්‍රය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඉහත ක්‍රියාකාරකම මෙම නිර්ණායක ඇසුරෙන් තක්සේරුව හා ඇගයීම සිදුකරන්න.

- පාසලේ ඉතිහාසය විස්තර කරයි
- පාසල ගොඩනැගීමට දායක වූවෝ අගය කරයි
- පාසලේ ඉතිහාසය ඇසුරින් ඉතිහාසය යනු මිනිසා කළ කී දෑ බවට සාක්ෂි දරයි
- පැහැදිලි හා නිර්මාණශීලී අයුරින් රචනය සකසයි
- පන්තියේ සෙසු අය හා දැනුම බෙදා හදා ගනියි

**නිපුණතා මට්ටම**

6.2 මිනිසා පරිහරණය කළ දෑ තුළින් ඉතිහාසය ගොඩනගයි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 02**

**ඉගෙනුම් පල**

- මූලාශ්‍රය හඳුන්වයි
- මූලාශ්‍රය ඇසුරින් ඉතිහාසය පැහැදිලි කරයි
- විවිධ ක්‍රම මගින් කාලය මනියි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න.

1.2 මිනිසාගේ අතීත කතාව ගොඩනගා ගන්නා ආකාරය

- අතීත කාලවල දී මිනිසා විසින් කළ දෑ පිළිබඳ ව දැන ගැනීමට ඉවහල් වන සාක්ෂි ඇතුළත් දේ මූලාශ්‍රය නමින් හැඳින්වීම
- ගෙවී ගිය කාලයේ සිදු වූ දේවල් දැනගැනීමට මූලාශ්‍රය ඉවහල්වන බව විස්තර කිරීම
- ඉතිහාසය ඉගෙනීමට ඇති මූලාශ්‍රයවල විවිධතා පෙන්වා දීම

  1 සාහිත්‍ය මූලාශ්‍රය
  පැරණි කාලයේ ලියා ඇති නොයෙකුත් ලිපි, ලේඛන, ජනකථා හා ජනකවි

  2 පුරාවිද්‍යා මූලාශ්‍රය
  පුරාණ කාලයේ මිනිසුන් භාවිතා කළ ද්‍රව්‍ය හා මෙවලම්, පැරණි ගොඩනැගිලි, පිළිම, කාසි, මැටි භාජන ආදී

ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි මූලාශ්‍රය ඇසුරින් වගුවක් සම්පූර්ණ කරන්න

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- පාසලේ ඉතිහාසය ගොඩනැගීමට උපකාරී වූ මූලාශ්‍රය සිසුන් සමග සාකච්ඡා කරමින් හුණු පුවරුවේ සටහන් කරන්න.
- පහත සඳහන් වගුව සිසුන්ට අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට අවස්ථාව දී හුණු පුවරුවේ ඇති මූලාශ්‍රය වගුවට යෙදීමට උපදෙස් දෙන්න.

| සාහිත්‍යමය මූලාශ්‍රය | පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය |
|---|---|
| | |

**ගුණාත්මක යෙදවුම්**

- සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය පෙන්වීමට අදාළ රූපසටහන්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඉහත ක්‍රියාකාරකම සඳහා මෙම නිර්ණායක ඇසුරෙන් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න

- මූලාශ්‍රය නම් කරයි
- මූලාශ්‍රයවල විවිධතා පැහැදිලි කරයි
- මූලාශ්‍රය ඇසුරින් ඉතිහාසය ගොඩනගයි
- ගුරු සිසු සාකච්ඡාවට සහභාගිවෙයි
- සහයෝගයෙන් කටයුතු කරයි

1.3 කාලය මැන ගැනීම

- වර්තමානයේ ප්‍රධාන වශයෙන් භාවිත වන වර්ෂ ක්‍රම
    - ක්‍රිස්තු වර්ෂ • බුද්ධ වර්ෂ • ශක වර්ෂ • හිජ්රි වර්ෂ
- මෙම වර්ෂ ක්‍රමවල ආරම්භය පැහැදිලි කිරීම
    - ක්‍රිස්තු වර්ෂ - ක්‍රිස්තුස්වහන්සේගේ උපත සිදු වූ දින
    - බුද්ධ වර්ෂ - බුදුරජාණන්වහන්සේගේ පරිනිර්වාණය සිදු වූ දින
    - ශක වර්ෂ - ඉන්දියාවේ බටහිර ප්‍රදේශය පාලනය කළ ගෞතමී පුත්‍ර සාතකර්ණී රජු ශකවරුන් පරදා එම ප්‍රදේශය ජයග්‍රහණය සිදු වූ දිනය සිහිපත් කිරීම
    - හිජ්රි වර්ෂ - මුහම්මද්තුමා මක්කා නගරයේ සිට මදීනා නගරයට යාම සිදු වූ දින සිහිපත් කිරීම
- ක්‍රිස්තු පූර්ව හා ක්‍රිස්තු වර්ෂ පැහැදිලි කිරීම
- මෙම වර්ෂ ක්‍රමවලින් කාලය මැන ගන්නා ආකාරය පැහැදිලි කිරීම
    - ක්‍රිස්තු වර්ෂ හා බුද්ධ වර්ෂ අතර වෙනස පැහැදිලි කිරීම

ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි විවිධ සිදුවීම් ක්‍රිස්තුවර්ෂයෙන් හා බුද්ධ වර්ෂයෙන් දැක්වීම

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- පහත සඳහන් සිදුවීම් බුද්ධ වර්ෂ වලින් / ක්‍රිස්තු වර්ෂ වලින් / හිජ්රි වර්ෂය අභ්‍යාස පොතේ සටහන් කරගැනීමට උපදෙස් දෙන්න.

1. බුදුරජාණන්වහන්සේගේ පිරිනිවන් පෑ වසර ______________ ක්‍රිස්තු වර්ෂවලින්
2. ක්‍රිස්තුස්වහන්සේගේ උපත ________________ බුද්ධ වර්ෂවලින්
3. මහම්මද්තුමාගේ උපත ___________________ ක්‍රිස්තු වර්ෂවලින්, බුද්ධ වර්ෂ වලින්
4. ඔබ උපන් වර්ෂය ____________________ ක්‍රිස්තු වර්ෂ හා බුද්ධ වර්ෂවලින්
5. වර්තමාන වර්ෂය _______ ක්‍රිස්තු හා බුද්ධ වර්ෂවලින් , හිජ්රි වර්ෂවලින්

( මේ සඳහා පෙළපොත බලන්න)

**ගුණාත්මක යෙදවුම්**

විවිධ වර්ෂ ක්‍රම සඳහන් කැලැන්ඩර්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඉහත ක්‍රියාකාරකම මෙම නිර්ණායක ඇසුරෙන් තක්සේරුව හා ඇගයීම සිදුකරන්න

- කාලය මැනගැනීම සඳහා යොදා ගන්නා විවිධ වර්ෂ ක්‍රම නම් කරයි
- ක්‍රිස්තු පූර්ව හා ක්‍රිස්තු වර්ෂ යෙදෙන අයුරු පැහැදිලි කරයි
- ක්‍රිස්තු වර්ෂ හා බුද්ධ වර්ෂ අතර වෙනස පහදයි
- විවිධ සිදුවීම් ක්‍රිස්තු වර්ෂ, බුද්ධ වර්ෂ හා හජ්රි වර්ෂවලින් දක්වයි
- අන් අය හා සහයෝගයෙන් කටයුතු කරයි

## 6.2 ආදි මිනිසා

මීට වසර බිලියන ගණනාවකට පෙර බිහි වූ ප්‍රථිවිය අධික ලෙස උණුසුම් ව තිබී ක්‍රමයෙන් නිවී, ඝන වී හා සිසිල් වී ජීවී පරිසරයක් බිහිවිය. පොළව බිහිවී ඉතා දීර්ඝ කාලයකට පසු පැලෑටි බිහිවීම, පැලෑටි බිහිවී ඉතා දීර්ඝ කාලයකට පසු ජලජ හා ගොඩබිම සතුන් බිහිවීම හා ඊටත් ඉතා දීර්ඝ කාලයකට පසු මිනිසා පහලවීම සිදුවිය. මිනිසා ජීවත් වූ පරිසරය අනුව මිනිසාගේ දේහ ලක්ෂණ වෙනස් වෙමින් වර්තමාන මිනිසා දක්වා විකාශනය වූ කතා පුවත මෙම ඒකකයෙන් විස්තර වේ.

**නිපුණතාව**

- මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි

**නිපුණතා මට්ටම**

2.1 පාරිසරික සාධක මත ජීවීන්ගේ ආරම්භය සහ මානවයා බිහිවීම විස්තර කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 03**

**ඉගෙනුම් පල**

- පෘථිවියේ උපතට පසු දිගු කලක් ගත වී මිනිසා බිහි වූ බව පැහැදිලි කරයි.
- මිනිසා බිහිවීමට පෙර පැලෑටි හා සතුන් බිහි වූ බව විස්තර කරයි.
- මිනිසා බිහි වූ පරිසරය පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න.

2.1 මිනිසා බිහිවූ පරිසරය

- මිනිසා බිහිවීමට පෙර ලෝකයේ පැවති තත්ත්වය
  - පෘථිවියේ උපත
    පෘථිවියේ උපත පිළිබඳ විවිධ විද්‍යාත්මක මත තිබේ. පෘථිවිය මුල් කාලයේ ඉතා උණුසුම්ව පැවතුණි. පසු ව ක්‍රමයෙන් සිසිල් වී ජීවී පරිසරයට සුදුසු ආකාරයට සකස් විය. මෙය ඉතා දීර්ඝ කාලයක් තිස්සේ සිදුවන්නට ඇති බව විස්තර කිරීම
  - පෘථිවිය බිහිවී ඉතා දීර්ඝ කාලයකට පසු මිනිසා බිහිවීම සිදු වූ බව පැහැදිලි කිරීම
  - මිනිසා බිහිවීමට පෙර ජලයෙහි හා ගොඩබිම විසූ සතුන් හා ඔවුන් විසූ යුග පැරණි ජීවීන් විසූ යුග
  - හැකිතරම් පින්තූර යොදා ගනිමින් පාඩම පැහැදිලි කරන්න
    - මුල් ම ජීවීන් මුහුදේ පහළවීම
      ඒක සෛලිකයෝ, මූදු හතු, පණුවෝ, සන්ධිපාදකයෝ, කෘමීන්, පක්ෂීන්, උරගයින්, යනාදී වශයෙන් ජීවය බෙදී විකාශනය වූ ආකාරය

- මිනිසා බිහිවීමට බලපෑ පරිසරයේ ස්වභාවය
    - අධික ශීත දේශගුණය
    - අධික ශීත නිසා බොහෝ සතුන් වඳ වී යාම
    - උණුසුම් කාලගුණයක් ඇතිවීම


ඉහත විෂය අන්තර්ගත කොටස් ආවරණයවන පරිදි පහත කරුණු ඇසුරෙන් පෘථිවියේ බිහිවීම, පැලෑටි, සත්ත්ව හා මිනිසා බිහිවීම ක්‍රමික ව සිදු වූ ආකාරය පිළිබඳ කාලනුරූප අවබෝධයක් ලැබෙන අයුරින් පින්තූර එකතුවක් සැකසීමට උපදෙස් දෙන්න

- කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කර ක්‍රියාකාරකම සිදුකිරීමට උපදෙස් දෙන්න
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 01 කාර්ය පත්‍රිකාව, ඇමුණුම 02 රූප සටහන් කණ්ඩායම්වලට බෙදා දී ක්‍රියාකාරකම සඳහා යොමු කරන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් පන්තියේ සැමට පෙනෙන පරිදි බිත්තියේ අලවන්න

**ගුණාත්මක යෙදවුම්**

**ඇමුණුම 01**



**කාර්ය පත්‍රිකාව**





- මෙම සටහන A 3 හෝ බ්‍රිස්ටල් බෝඩ් එකක ඇඳගන්න (පින්තූර ඇලවීමට සුදුසු පරිදි)
- එක් කණ්ඩායමකට එක බැගින් වන සේ සැකසිය යුතුය
- ඇමුණුම 02 හි ඇති රූප කපා කාලානුරූප පිළිවෙල ගොඩනැගෙන පරිදි සටහනෙහි පින්තූර අලවන්න
- ක්‍රියාකාරකම අවසානයේ පන්තියට පෙනෙන පරිදි බිත්තියේ අලවන්න


**ඇමුණුම 02**












**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඉහත ක්‍රියාකාරකම මෙම නිර්ණායක ඇසුරෙන් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න.

- මිනිසා පහළවීමට පෙර පැවති ජීවී පරිසරය විස්තර කරයි
- ජීවී පරිසරය කාලානුරූප ව පෙළ ගස්වයි
- මිනිසා පහළවීම ඉතා දීර්ඝ කාල පරිච්ඡේදයක් තුළ විවිධ ක්‍රියාදාමවල ප්‍රතිඵලයක් බව ප්‍රකාශ කරයි
- කණ්ඩායම් හැඟුමෙන් කටයුතු කරයි
- තොරතුරු පැහැදිලි කිරීමට ඉදිරිපත් වෙයි

**නිපුණතා මට්ටම**

2.2 දේහ ලක්‍ෂණ වෙනස් වෙමින් මානව පරිණාමය සිදු වූ ආකාරය පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 02**

**ඉගෙනුම් පල**

- මානව පරිණාමය විස්තර කරයි
- මානව පරිණාමයට හේතු දක්වයි
- නූතන මිනිසාගේ බිහිවීම දිගුකාලීන ක්‍රියාවලියක් බව පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

**2.2 ආදි මිනිසාගේ විකාශනය**

ආදි මිනිසාගේ විකාශනය ප්‍රධාන අංශ 02 කි

I කායික පරිනාමය

දේහ ලක්‍ෂණ වෙනස් වීම

- හිස්කබලේ හැඩය
- දෙපාමත කෙලින් ඇවිදීමේ හැකියාව

II සංස්කෘතික පරිණාමය (මෙම කොටස 2.4 ඒකකයෙන් සාකච්ඡා කෙරේ)

ජීවන අවශ්‍යතා ඉටුකර ගැනීම අනුව මිනිසාගේ විකාශනය වීම

- මෙවලම් නිපදවීම
- පරිසරයට අනුවර්තනය වීම
- ගැටලු විසඳාගැනීම
- නගර තනා ගැනීම

I දේහ ලක්‍ෂණ අනුව මිනිසාගේ විකාශනය

මෙය පෙළපොතේ ඇති රූපසටහන් ඇසුරින් පෙන්වා දෙන්න

- මිනිසාගේ පළමු පරිණාමීය අවධිය
    - ඔස්ට්‍රොලෝපිතිකස් නම් වානර මානවයා හඳුන්වා දීම
- මිනිසාගේ දෙවන පරිණාමීය අවධිය
    - හෝමෝ හැබිලිස්
- හෝමෝ ඉරෙක්ටකස්
- හෝමෝ නියැන්ඩතාල්ලෙන්සිස්
- නූතන මිනිසා - හෝමෝසාපියන්ස්
    - දියුණු මොළයක් ඇති මානවයා
    - අද ලෝකයේ සැම ජනකොටසක් ම පැවත එන්නේ මෙම මානව වර්ගයෙන් බව පැහැදිලි කිරීම

ඉහත විෂය කරුණු අවධාරණය වන පරිදි මිනිසාගේ විකාශනයේ විවිධ අවධි චිත්‍රයට නැගීම.

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- වානර මානවයාගේ සිට නූතන මිනිසා දක්වා එක් එක් මානව වර්ධනයේ සිදුවීම්වලට අදාල පින්තූර ඉදිරිපත් කරමින් සිසුන් සමඟ සාකච්ඡා කරන්න
- මිනිසාගේ විකාශනය දීර්ඝකාලයක් තුළ විවිධ ක්‍රියාදාමවල ප්‍රතිඵල මත සිදු වූ බව පැහැදිලි කරන්න
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 01හි ක්‍රියාකාරකම් කණ්ඩායම් අතර බෙදා දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම අවසානයේදී තම නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

**ඇමුණුම 01**

**කාර්ය පත්‍රිකාව**

කණ්ඩායම 01 - ඔස්ට්‍රාලෝපිතිකස් හා හෝමෝ හැබිලස්

කණ්ඩායම 02 - හෝමෝහැබිලස් හා හෝමෝඉරෙක්ටකස්

කණ්ඩායම 03 - හෝමෝඉරෙක්ටකස් හා හෝමෝනියැන්ඩතාලෙන්සිස්

කණ්ඩායම 04 - හෝමෝනියැන්ඩතාලෙන්සිස් හා හෝමෝසාපියන්ස්

**සැලකිය යුතු කරුණු**

- ඒ ඒ මානවයාගේ කැපී පෙනෙන දේහ ලක්ෂණ මතුවන පරිදි චිත්‍ර දෙක අඳින්න. මේ සඳහා පෙළපොත බලන්න
- චිත්‍රය භාවිත කරමින් ඒ ඒ මානවයාගේ දේහ ලක්ෂණ පැහැදිලි කරන්න

- මිනිසාගේ කායික පරිනාමය දැක්වෙන රූප සටහන්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- මානවයාගේ විශේෂ ලක්ෂණ සඳහන් කරයි
- මානවයාගේ කැපීපෙනෙන අංග ලක්ෂණ මතුවන අයුරින් චිත්‍රය අඳියි
- මිනිසා පහලවීම දීර්ඝ, දුෂ්කර ගමනක ප්‍රතිඵලයක් බව ප්‍රකාශ කරයි
- සාමූහික ව නිර්මාණය කරයි
- ක්‍රියාකාරකම සාර්ථක කර ගැනීමට නායකත්වය ගෙන කටයුතු කරයි

**නිපුණතා මට්ටම**

2.3 ස්වභාවික පරිසරයට අනුවර්තනය වීමේ දී දේහ ලක්‍ෂණ වෙනස්වන ආකාරය නූතන මිනිසා ඇසුරෙන් පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාවː** 01

**ඉගෙනුම් පල**

- විවිධ පරිසර තත්ත්ව විස්තර කරයි
- විවිධ පරිසර තත්ත්ව අනුව මිනිසාගේ දේහ ලක්‍ෂණ වෙනස්වන ආකාරය පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න

2.3 භූගෝලීය සාධක අනුව මිනිසාගේ දේහ ලක්‍ෂණ වෙනස් වීම

මේ සඳහා පෙළපොතේ ඇති පින්තූර ඇසුරින් පාඩම විස්තර කරන්න

- හෝමෝසාපියන්ස් ක්‍රමයෙන් ලෝකය පුරා පැතිරීම
- පරිසරයේ විවිධතා මත මිනිසාගේ හැඩරුව වෙනස් වීම
- දේහ ලක්‍ෂණ වෙනස්වීමට බලපාන විවිධ පරිසර තත්ත්ව
  - සූර්ය රශ්මිය, වියලි ප්‍රදේශ
  - ශීත දේශගුණය
  - කඳු, තැනිතලා
- මොන්ගෝලයිඩ්, කෝකසයිඩ්, නීග්‍රොයිඩ්,ඔස්ට්‍රලොයිඩ් සහ මීට අමතර ව විවිධ දේහලක්‍ෂණ සහිත මිනිස් වර්ග
- පාරිසරික බලපෑම මත දේහ ලක්‍ෂණ සහ සංස්කෘතිය වෙනස් වුවත් සෑම මිනිසෙක් ම එක ම මූලයකින් පැවත එන බව

- මෙම විෂය අන්තර්ගතය ආවරණයවන පරිදි විවිධ දේශගුණික කලාප යටතේ රටවල මිනිසුන්ගේ පින්තූර එකතුකර එක් එක් දේශගුණික තත්ත්වයන් යටතේ මිනිසාගේ දේහ ලක්ෂණ වෙනස්වන ආකාරය පැහැදිලි කිරීමට පින්තූර පොතක් සකසන්න
- මෙය කේවල ක්‍රියාකරකම් ලෙස යොදාගන්න
- ක්‍රියාකාරකම සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ රටවල මිනිසුන්ගේ රූප

**ගුණඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- විවිධ දේහ ලක්ෂණ සහිත මිනිස් වර්ග නම් කරයි
- පරිසරයේ විවිධතා මත මිනිසාගේ හැඩරුව වෙනස් වීම පැහැදිලි කරයි
- මිනිසාගේ හැඩරුව වෙනස් වීම පැහැදිලිවන අයුරින් පිංතූර පොත සකස් කරයි
- නිර්මාණශීලී ව පොත සකසයි
- කාල කළමණාකරණය කරයි

**නිපුණතා මට්ටම**

2.4 ආදි මිනිසා මුහුණ පෑ අභියෝග ජයගත් ආකාරය විමසා බලා වර්තමානය සමඟ සසඳමින් අනාගත අභියෝගවලට මුහුණදීමේ කුසලතාව වර්ධනය කර ගනියි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 02**

**ඉගෙනුම් පල**

- ආදි මිනිසා මුහුණදුන් අභියෝග පෙන්වා දෙයි
- අභියෝග ජයගත් ආකාරය පැහැදිලි කරයි
- අතීත ආදර්ශ අනුව වර්තමාන අභියෝග ජයගත හැකි ආකාරය පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

2.4 මිනිසාගේ සංස්කෘතික පරිණාමය

- ජීවන අවශ්‍යතා ඉටුකර ගැනීම අනුව මිනිසාගේ විකාශනය
- මිනිසා, ස්වභාවික පරිසරය හා අභියෝග
- මිනිසා භාවිත කළ මෙවලම් අනුව ප්‍රධාන යුග
    - පූර්ව ශිලායුගය
    - මධ්‍ය ශිලායුගය
    - නව ශිලායුගය
- එක් එක් යුගවල දී අත්කර ගත් ජයග්‍රහණ

ඉහත විෂය කරුණු ආවරණයවන පරිදි මිනිසාගේ සංස්කෘතික පරිණාමය පිළිබඳ සොයා බැලීම

- මෙම ක්‍රියාකාරකම සඳහා පන්තියේ සියලු ම සිසුන් සහභාගි කරගන්න
- මිනිසාගේ අවශ්‍යතා සපුරා ගැනීමේ දී පූර්වශිලා, මධ්‍යශිලා, නවශිලා වශයෙන් යුග හා ඒ ඒ යුගවල දී අත්පත් කරගත් ජයග්‍රහණ පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න
- ඇමුණුම 01 කාර්ය පත්‍රිකාව අනුව ක්‍රියාකාරකම කරවන්න
- ඇමුණුම 02 හි වගුව හුණු පුවරුවේ සටහන් කර ඒ ඒ කණ්ඩායමට අදාළ කොටස පිරවීමට පවරන්න
- වගුවේ අඩුපාඩු සකස් කර පාඩම සමාලෝචනය කරන්න
- වගුව අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට අවස්ථාව දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

ඇමුණුම 01

## කාර්ය පත්‍රිකාව

| | | |
|---|---|---|
| පූර්ව ශිලා යුගය | මධ්‍ය ශිලා යුගය | නව ශිලා යුගය |
| මෙවලම් නිපදවීම | චිත්‍ර ඇඳීම | ගොවිතැන් ආරම්භවීම |

**ගුරු උපදෙස්**

- ඉහත ආකාරයට එක් එක් යුග හා ඒ යුගවල දී අත්පත් කරගත් ජයග්‍රහණ තුණ්ඩුවල ලියන්න
- එය පන්තියේ සිසුන් ගණන අනුව සකසා ගන්න
- පන්තියේ සියලු ම සිසුන්ට තුණ්ඩු බෙදා දෙන්න ඒ ඒ යුග හා ඊට අදාළ ජයග්‍රහණ සඳහන් තුණ්ඩු ලබාගත් අය යුග අනුව කණ්ඩායම් තුනකට වෙන්වන ලෙස උපදෙස් දෙන්න
- හුණු පුවරුවේ සඳහන් වගුවේ තම කණ්ඩායමට අයත් කොටුව පිරවීමට යොමු කරන්න

**සිසු උපදෙස්**

- ගුරුවරයාගෙන් තුණ්ඩු ලබාගන්න
- ඒ අනුව තමාට අයත් කණ්ඩායම හා එක්වන්න
- හුණු පුවරුවේ සඳහන් වගුවේ තම කණ්ඩායමට අයත් කොටුව පුරවන්න

ඇමුණුම 02

| පූර්ව ශිලායුගයේ අත් කර ගත් ජයග්‍රහණ | මධ්‍ය ශිලායුගයේ අත් කර ගත් ජයග්‍රහණ | නව ශිලායුගයේ අත් කර ගත් ජයග්‍රහණ |
|---|---|---|
| | | |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න.

- භාවිත කළ මෙවලම් අනුව මිනිසා පසු කළ යුග නම් කරයි
- එක් එක් යුගවල දී මිනිසා අත්පත් කරගත් ජයග්‍රහණ සඳහන් කරයි
- මිනිසා පරිසරය ජයගත් අයුරු පෙන්වා දෙයි
- ක්‍රියාශීලී ව හැසිරෙයි
- සාමූහික හැඟුමෙන් කටයුතු කරයි

## 6.3 ලෝකයේ පැරණි ශිෂ්ටාචාර

වානර පරම්පරාවකින් බිහි වූ මිනිසා දිගුකාලයක් තිස්සේ අද පවතින තත්ත්වයට ක්‍රමයෙන් දියුණු විය. එසේ දියුණුවීමේ ඉහළ ම අවස්ථාව හැඳින්වෙන්නේ ශිෂ්ටාචාරය යන නමිනි. ලෝකයේ විවිධ ප්‍රදේශවල ජීවත්වන මිනිසුන් එකිනෙකට වෙනස් කාලවලදී ශිෂ්ටාචාරවත් බවට පත්විය. ශිෂ්ටාචාරයක් යනු කුමක් ද යන්න නිර්වචනය කිරීමත් කිසියම් සමාජයක් ශිෂ්ටාචාරික තත්ත්වයට පත් වූ බව පෙන්නුම් කරන ලක්ෂණ හඳුන්වාදීමත් පුරාණ ශිෂ්ටාචාර මගින් මනුෂ්‍ය සමාජය වෙත කර තිබෙන දායකත්වය පැහැදිලි කිරීමත් මෙම ඒකකයෙන් අපේක්ෂිත ය.

**නිපුණතාව**

- මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම**

3.1 ලෝකයේ පැරණි ශිෂ්ටාචාර පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 03**

**ඉගෙනුම් පල**

- ශිෂ්ටාචාරය යනු කුමක්දැයි විස්තර කරයි
- ශිෂ්ටාචාරයක මූලික ලක්ෂණ පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

3.1 ශිෂ්ටාචාරය හැඳින්වීම

- ග්‍රාමීය සමාජයක් නාගරික සමාජයක් බවට පරිවර්තනය වීමෙන් ශිෂ්ටාචාරයක් හටගන්නා බව
- සමාජයක් ශිෂ්ටාචාරවීමට දීර්ඝ කාලයක් ගත වන බව පැහැදිලි කිරීම
- ගමක ලක්ෂණ පැහැදිලි කර නගරය වෙනස්වන ආකාරය විස්තර කිරීම
- ශිෂ්ටාචාරය යනු කුමක්දැයි පැහැදිලි කිරිම
- ඕනෑ ම ශිෂ්ටාචාරික සමාජයක තිබිය හැකි ප්‍රධාන ලක්ෂණ හඳුන්වා දීම. ඉන් කිහිපයක් පහත දැක්වේ.
  - ★ අකුරු භාවිත කිරීමට පුරුදුවීම
  - ★ වැඩි පිරිසක් අදහන ආගමක් ඇතිවීම
  - ★ පිටරටවල් සමඟ වෙළඳාම ආරම්භ කිරීම
  - ★ පාලන ක්‍රමයක් තිබීම

ා	ගම හා නගරය අතර ඇති වෙනස හඳුනාගැනීමට පහත සඳහන් ක්‍රියාකාරකම සඳහා සිසුන් යොමු කරන්න.

- ඇමුණුම 02හි රූප පන්තියට පෙන්වමින් ගම හා නගරයක වෙනස සාකච්ඡා කරන්න
- අතීතයේ පැවති ගම හා නගර පිළිබඳ සාකච්ඡා කරන්න
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- එක් කණ්ඩායමකට එක් කාර්ය පත්‍රිකාවක් ( ඇමුණුම 01) ලබා දෙන්න
- අතීත ගමක් හා අතීත නගරයක් චිත්‍රයට නැගීමට උපදෙස් දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම පන්තියේ ප්‍රදර්ශනය කරන්න

**ගුණාත්මක යෙදවුම්**

ඇමුණුම 01 සහ ඇමුණුම 02

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න

- අතීත ගමක හා අතීත නගරයක ලක්ෂණ නම් කරයි
- අතීත ගම තුළින් නගරය ගොඩනැගී ඇති බව පිළිගෙන ප්‍රකාශ කරයි
- නිර්මාණාත්මක ව චිත්‍රය ඇඳීම
- කණ්ඩායම් සහයෝගයෙන් ක්‍රියාකරයි
- කාලය කළමනාකරණය කරයි

**ඇමුණුම 01**

කාර්ය පත්‍රිකාව 01
අතීත ගමක ලක්ෂණ ඉස්මතු වන පරිදි චිත්‍රයක් අඳින්න
- චිත්‍රය පන්තියට ප්‍රදර්ශනය කරමින් විස්තර කරන්න

කාර්ය පත්‍රිකාව 02
අතීත නගරයක ලක්ෂණ ඉස්මතු වන පරිදි චිත්‍රයක් අඳින්න
- චිත්‍රය පන්තියට ප්‍රදර්ශනය කරමින් විස්තර කරන්න

ඇමුණුම 01

ගමක දර්ශනයක්



නගරයක දර්ශනයක්



**නිපුණතා මට්ටම**

3.2 ලෝකයේ පැරණි ශිෂ්ටාචාර සහ ඒවායේ භූගෝලීය ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 02**

**ඉගෙනුම් පල**

- ලෝකයේ පැරණි ශිෂ්ටාචාර නම් කරයි
- ශිෂ්ටාචාර පිහිටීම සිතියමක ලකුණු කරය.
- ශිෂ්ටාචාර පිහිටි ස්ථාන පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාව මෙහෙයවන්න

3.2 ලෝකයේ පැරණි ශිෂ්ටාචාර

- විවිධ කාලවල විවිධ ප්‍රදේශවල ස්වාධීන ව ශිෂ්ටාචාර වර්ධනය වූ බව පැහැදිලි කිරීම
- පැරණි ශිෂ්ටාචාර ව්‍යාප්තිය සහ කාලවකවානු පැහැදිලි කිරීම
- ශිෂ්ටාචාරවල ව්‍යාප්තිය සිතියම් මඟින් පෙන්වා දීම

**ගුණාත්මක යෙදවුම්**

සැලසුම් කරන ලද පාඩමට අදාළ ව අවශ්‍ය ද්‍රව්‍ය සකස් කර ගන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාඩමට අදාළ ව ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස්කර ලකුණු පවරන්න

**නිපුණතා මට්ටම**

3.3 පැරණි ශිෂ්ටාචාරවල දියුණුව ඇසුරින් වර්තමානයට ලබාගත හැකි ආදර්ශ පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 05**

**ඉගෙනුම් පල**

- පැරණි ශිෂ්ටාචාරවල දියුණුව පෙන්වා දෙයි
- ශිෂ්ටාචාරවල පෞරාණික බවට කරුණු දක්වයි
- පැරණි ශිෂ්ටාචාරවලින් ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

- පැරණි ශිෂ්ටාචාරවල දියුණුව පිළිබඳ ව උදාහරණ සහිත ව පැහැදිලි කරන්න
- ශිෂ්ටාචාරවලින් ලබාගත හැකි ආදර්ශ පෙන්වා දෙන්න

3.3 පැරණි ශිෂ්ටාචාරවලින් ලෝකයට උරුම වූ දායාද

සුමේරියානු ශිෂ්ටාචාරය

- අක්ෂර පද්ධතිය
- ගොඩනැගිලි
- පළමු ලිඛිත නීති පද්ධතිය
- ගණිත ක්‍රම

ඊජිප්තු ශිෂ්ටාචාරය

- මළසිරුරු කල්තබා ගැනීමේ ක්‍රම
- පිරමීඩ ඉදි කිරීම
- චිත්‍රාක්ෂර භාවිත කිරීම

ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

- නගර සැලැස්ම
- අක්ෂර පද්ධතිය
- ක්‍රමවත් ජලවහන ක්‍රම

**ගුණාත්මක යෙදවුම්**

ශිෂ්ටාචාර පිළිබඳ පොත්පත් හා පින්තූර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාඩමට අදාළ ව ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස්කර ලකුණු පවරන්න

## 6.4 ශ්‍රී ලංකාව ජනාවාස වීම

**හැඳින්වීම**

ආදී හෝමොසාපියන් මානවයා මෙරට ජනාවාස කිරීම,රට ඇතුළත ඔවුන්ගේ ව්‍යාප්තිය,ජීවන රටාව, ආදීය පිළිබඳ මෙහි දී අවධානය යොමු කර ඇත.

**නිපුණතාව**

- මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි

**නිපුණතා මට්ටම**

4.1 ශ්‍රී ලංකාවේ මුල් ජනාවාසවල ව්‍යාප්තිය සහ එහි කාල - අවකාශීය විවිධත්වය පහදයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 05**

**ඉගෙනුම් පල**

- ජනාවාස ව්‍යාප්ත වූ ප්‍රදේශ පෙන්වා දෙයි
- මුල් ජනාවාසවල ස්වරූපය හඳුන්වයි
- ආදි මානවයින් මෙරට විවිධ පරිසර කලාපවලට අනුවර්තනය වෙමින් ජීවත් වූ බව පහදයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න

4.1 මුල් ජනාවාස

- මුල් ජනාවාසවල ව්‍යාප්තිය
  - අදින් වසර එක් ලක්ෂ තිස්දාහකට පමණ පෙර ආදී හෝමෝසාපියන්ස් මානවයා ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයට සංක්‍රමණය වීම
  - දකුණු වෙරළ තීරයට අමතරව ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ඔවුන් ව්‍යාප්ත වූ බවට සාධක හමුවීම
  - ආදි මානවයා විවිධ පාරිසරික කලාපවල ව්‍යාප්ත වීම
    - තෙත් කලාපය
    - වියලි කලාපය
    - අර්ධ ශුෂ්ක කලාපය
  - ව්‍යාප්ත වූ ප්‍රදේශ දැනට පුරාවිද්‍යාත්මක වශයෙන් පරීක්ෂාකර තිබෙන ආදී මානවයාගේ වාසස්ථාන
    - බටදොඹ ලෙන
    - කිතුලගල ලෙන
    - පාහියන්ගල ලෙන
  - ජනාවාසවල ස්වභාවය
    - ආදි මානවයා වර්ෂා කාලවල දී වාසය පිණිස ගල්ගුහා තෝරා ගැනීම
    - වියළි කාලවල දී විවෘත ස්ථානවල පිහිටි දඩයම් තිප්පොල තම වාසස්ථාන බවට පත්කර ගැනීම

- ආහාර රටාව
    - සත්ත්ව ආහාර
    - ශාක ආහාර

- තාක්ෂණය
    - කුඩා ගල් මෙවලම් භාවිතය
    - ඇදහිලි හා විශ්වාස
    - ග්‍රාමීය ජනාවාස ඇති වීම
        - ස්ථිර ජනාවාස
          රත්නපුර දිස්ත්‍රික්කයේ කොළඹගේආර ප්‍රදේශයට අයත් උඩරංචාමඩමෙන් සොයාගත් අදින් වසර දහතුන්දාහකට පෙර ඉදි කළ වරිච්චි නිවස
        - මූලික ග්‍රාමීය ජනාවාසයන් හි කෘෂිකර්මය ප්‍රධාන ආර්ථික කටයුත්තක් වීම
        - ගොවිතැන සමඟ ගොවි බිම් ඇසුරින් කුඩා ගම් වැව් ඉදිවීම
        - ග්‍රාමීය ජනාවාස ඇති වීම
        - ලෝහ භාවිතය
        - ග්‍රාමීය ජන ජීවිතය වසර සිය ගණනක් තිස්සේ දියුණු වෙමින් පවතිද්දී වැසියා ඉන්දියන් සාගරය හරහා නොයෙකුත් රටවලට යාත්‍රා කිරීමෙන් වෙළෙඳාම ප්‍රචලිත වීම
- නගර බිහිවීම
    - නගර පිහිටුවීමේ පසුබිම
    - මෙරට මූලික නගර

නගර බිහිවීමේ මූලිකාංග සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම යොදාගත හැකිය.


පැරණි නගරවල මූලික ලක්ෂණ ඇසුරින් ආකෘතියක් සම්පූර්ණ කිරීම

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුම 01 හි ආකෘතිය හුණු පුවරුවේ සටහන් කර එය තම අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න
- පෙළපොත ද භාවිත කරමින් ආකෘතිය සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න

**ඇගයීම හා තක්සේරුකරණය පිළිබඳ උපදෙස්**

1. වියලි කලාපීය නාගරික ශිෂ්ටාචාරයේ ලක්‍ෂණ පහදයි
2. නාගරික ශිෂ්ටාචාරයේ වර්ධනයට බලපෑ හේතු දක්වයි
3. නගරවල ජීවත් වූවත් වියලි කලාපීය වැසියා පරිසර හිතකාමී ව කටයුතු කළ බව ප්‍රකාශ කරයි
4. නිවැරදිව ආකෘතිය සම්පූර්ණ කරයි
5. උපදේශ නිවැරදි ව පිළිපදියි

ඇමුණුම 01


වියලි කලාපීය නාගරික ශිෂ්ටාචාර
බිහිවීමේ පසුබිම
1.
2.
3.
ඵල
කෘෂිකර්මාන්තය
නාගරික ශිෂ්ටාචාරයේ වර්ධනය
ලක්ෂණ
1.
2.
3.
ප්‍රතිඵල
ප්‍රතිඵල
ප්‍රතිඵල
ප්‍රතිඵල

## 6.5 අපේ කීර්තිමත් රජවරු

අනුරාධපුරය රාජධානිය බවට පත්කරගත් පණ්ඩුකාභය රජතුමාගේ සිට ධාතුසේන රජතුමා දක්වා රජවරු හත් දෙනෙකු පිළිබඳ මෙම ඒකකයෙන් විස්තර වේ. එම රජවරුන්ගේ ජන හිතකාමී පාලනය, ශ්‍රේෂ්ඨත්වය හා එයින් ගතහැකි ආදර්ශ පිළිබඳ අවධානය යොමුකර ඇත.

**නිපුණතාව**

- අතීත ශ්‍රී ලාංකික රජවරුන්ගේ චරිතාපදාන හා ජාතික සේවාව අගයමින් ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය විමසා බලයි

### 6.5.1 පණ්ඩුකාභය රජතුමා

**නිපුණතා මට්ටම**

5.1.1 පණ්ඩුකාභය කුමරු අභියෝග ජය ගනිමින් රාජ්‍යත්වයට පත් වූ ආකාරය විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 01**

**ඉගෙනුම් පල**

- පණ්ඩුකාභය රජුගේ ළමා කාලය පිළිබඳ තොරතුරු විස්තර කරයි
- පණ්ඩුකාභය කුමරු මුහුණදුන් අභියෝග පෙන්වාදෙයි
- අභියෝග ජය ගැනීමට පණ්ඩුකාභය චරිතයෙන් ගතහැකි ආදර්ශ විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න

5.1 **පණ්ඩුකාභය රජතුමා**

ළමා කාලය

- පණ්ඩුකාභය කුමරුගේ මව්පියන් පිළිබඳ කථා පුවත් පැහැදිලි කරන්න
- කුමරු උපන් මොහොතේ සිට මුහුණ දුන් අභියෝග විස්තර කරන්න
  - ★ උපන් අවස්ථාවේ රජමාලිගයෙන් පිටත් කිරීම
  - ★ දොරමඩලාවට යන අවස්ථාවේ කුමරු මරණයට පත් කිරීමට තැත් කිරීම
  - ★ කුමරු දිය නාමින් සිටි අවස්ථාව
  - ★ ගොපළු දරුවන් සමඟ ක්‍රීඩාකරමින් සිටි අවස්ථාව
- අභියෝග ජයගැනීමට පණ්ඩුකාභය චරිතයෙන් ගතහැකි ආදර්ශ පෙන්වා දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

සැලසුම් කරන ලද පාඩමට අදාළ ව අවශ්‍ය ද්‍රව්‍ය සකස් කර ගන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාඩමට අදාළ ව ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස්කර ලකුණු පවරන්න

**නිපුණතා මට්ටම**

5.1.2 පණ්ඩුකාභය රජතුමාගේ කාර්ය සාපල්‍යතාවය විමසා බලයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- පණ්ඩුකාභය රජතුමා රාජ්‍යත්වයට පත් වූ ආකාරය පහදයි
- පණ්ඩුකාභය රජතුමාගේ රාජ්‍ය පාලනය විස්තර කරයි
- පණ්ඩුකාභය රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වයට විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න.

**රාජ්‍යත්වයට පත්වීම**

- රාජ්‍යත්වයට පත්වීම සඳහා පණ්ඩුකාභය කුමරු අනුගමනය කළ ක්‍රියාමාර්ග විස්තර කරන්න
  - ★ සේනා සංවිධානය කිරීම
  - ★ සටනින් ජය ගැනීම
  - ★ අනුරාධපුරය පාලන මධ්‍යස්ථානය කර ගනිමින් රාජ්‍යත්වයට පත්වීම

**පාලනය**

- අනුරාධ ග්‍රාමය, අනුරාධපුරය බවට පත් කිරීම
- අනුරාධපුර නගරය නිර්මාණය කිරීම
  - ★ නගර සීමා ලකුණු කිරීම
  - ★ රජමාලිගා, මංමාවත්, වීථි, කාණු පද්ධති, සුසානභූමි, ආරෝග්‍යශාලා, සතර වාහල් දොරටු
- නගර පාලන කටයුතු සඳහා නිලධාරීන් පත් කිරීම
- විවිධ ජන කොටස් සඳහා නගරයේ ප්‍රදේශ වෙන් කිරීම
- ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම (බ්‍රාහ්මණ, ජෛන, යක්ෂ යක්ෂණීන් පිදීම)
- ආර්ථික කටයුතු සඳහා ගත් ක්‍රියාමාර්ග (වැව් ඉදිකිරිම)

**ගුණාත්මක යෙදවුම්**

සැලසුම් කරන ලද පාඩමට අදාළ ව අවශ්‍ය ද්‍රව්‍ය සකස් කර ගන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාඩමට අදාළ ව ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස්කර ලකුණු පවරන්න

## 6.5.2 දේවානම්පියතිස්ස රජතුමා

**නිපුණතාව**

- අතීත ශ්‍රී ලාංකික රජවරුන්ගේ චරිතාපදාන හා ජාතික සේවාව අගයමින් ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය විමසා බලයි

**නිපුණතා මට්ටම**

5.2.1 ශ්‍රී ලංකාවට බුදු දහම ගෙන ඒම හා ස්ථාපිත කිරීමෙහි ලා දේවානම්පියතිස්ස රජුගේ සේවය මතුකර දක්වයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- ලංකාවට බුදු දහම ලැබුණු අයුරු විස්තර කරයි
- බුද්ධ සාසනය ලංකාවේ ස්ථාපිත වූ අයුරු විස්තර කරයි
- දේවානම්පියතිස්ස රජුගේ සේවාව පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

5.2.1ලංකාවට බුදු දහම ගෙන ඒම

- තිස්ස කුමරු ලංකාවේ පාලකයා බවට පත්වීම
- ලංකාවේ තිස්ස රජතුමාට සමකාලීන ව ඉන්දියාවේ පාලකයා අශෝක අධිරාජ්‍යයා වීම
- තිස්ස රජතුමා හා අශෝක අධිරාජ්‍යයා සමග සබඳතා පැවැත්වීම
- මිහිඳු මහ රහතන්වහන්සේ පුමුඛ ධර්ම දූත පිරිස ශ්‍රී ලංකාවේ මිහින්තලයට වැඩම කිරීම
- දේවානම්පියතිස්ස රජතුමා මිහිඳු මහ රහතන්වහන්සේගෙන් බණ අසා බුදු දහම වැළඳ ගැනීම හා ලක්දිව ප්‍රථම බෞද්ධ පාලකයා බවට පත්වීම

5.2.1 බුද්ධ සාසනය ස්ථාපිත කිරීම

- රජතුමා බුදු දහම වැළඳ ගැනීමෙන් පසු රජ පවුලේ පිරිස් හා සෙසු ජනයා බෞද්ධයන් බවට පත්වීම
- ප්‍රථම ආරාම පූජාව
- භික්ෂු සාසනය ස්ථාපිත කිරීම
- සංඝමිත්තා තෙරණිය 18 කුලයක පිරිස සමග ශ්‍රී මහා බෝධිය වැඩම කිරීම
- ශ්‍රී මහා බෝධිය රෝපණය කිරීම
- භික්ෂුණී සාසනය ස්ථාපිත කිරීම
- සිවුවනක් පිරිසෙන් යුතු සමාජයක් බිහිවීම
- ප්‍රථම ස්තූපය ඉදිකිරීම
- දේවානම්පියතිස්ස රජුගෙන් සිදු වූ සේවාව උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

බුදු දහම ස්ථාපිත කිරීම පිළිබඳ ඇති පොත්පත්, පින්තූර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාඩමට අදාළ ව ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස්කර ලකුණු පවරන්න

**මූලික වදන්/ සංකල්ප**

සිව්වනක් පිරිස :- භික්ෂු / භික්ෂුණී, උපාසක / උපාසිකා

**නිපුණතා මට්ටම**

5.2.2 සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට බුදු දහමින් ලද ආභාසය ඇසුරින් යහපත් ගුණාංග වර්ධනය කර ගනියි

**කාලච්ඡේද සංඛ්‍යාවː 02**

**ඉගෙනුම් පල**

- බුදු දහමින් ලද දායාද විස්තර කරයි
- බුදු දහමින් සදාචාරාවත් ජන සාමාජයක් ගොඩනැගුණු අයුරු පැහැදිලි කරයි
- වර්තමාන යහපත් ජන සමාජයක් සඳහා යොදා ගත හැකි අතීත ආදර්ශ පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න.

5.2.3 2 බුදු දහමින් ලද දායාද

- බුදු දහම නිසා විවිධ ක්ෂේත්‍රවල වෙනස්කම් සිදුවීම
  - ⋆ සංවිධානාත්මක ආගමක් ලැබීම

  පහත සඳහන් කරුණු ඉස්මතු කරන්න

  - ⋆ අර්ථවත් ලෙස වත්පිළිවෙත් අනුගමනය කිරීම උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න
  - ⋆ ගස් ගල් හා පර්වත වැඳීම - බෝධි හා චෛත්‍ය වන්දනාව
  - ⋆ මලවුන් පිදීම - මළවුන්ට පින් දීම
  - ⋆ ගිනි දෙවියන් පිදීම - පහන් පූජා කිරීම
  - ⋆ යක්ෂ, යක්ෂිනියන්ට බලි බිලි පූජා කිරීම - දන් දීම
- ලේඛන කලාව හා සාහිත්‍ය
- අර්ථීක රටාව
- ජන ජීවිතය
- අතීත සමාජයේ පැවති සිරිත් විරිත් ආචාර ධර්ම, අන්තර් පුද්ගල සබඳතා උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න
- අතීත ආදර්ශ වර්තමානය සඳහා යොදා ගත හැකි ආකාරය උදාහරණ ඇසුරින් විස්තර කරන්න

ඉහත විෂය කරුණු ඉස්මතුවනසේ පහත සඳහන් ක්‍රියාකාරකම සිදුකරන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදාගන්න
- ඇමුණුම 01 හි ඇතුළත් වගුව පන්තියට ප්‍රදර්ශනය කරන්න
- වගුව අභ්‍යාස පොතේ පිටපත් කර ගැනීමට උපදෙස් දෙන්න
- පෙළපොත ද උපයෝගී කර ගනිමින් වගුව සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඇගයීම හා තක්සේරුකරණය සඳහා පහත සඳහන් නිර්ණායක කෙරෙහි අවධානය යොමු කරන්න

- බුදු දහමින් ලද දායාද නම් කරයි
- බුදු දහමින් ලද දායාද අගය කරයි
- නිවැරදි ව වගුව සම්පූර්ණ කරයි
- ගුරු උපදෙස් පිළිපදියි
- නියමිත කාලයට කාර්යය නිම කරයි

ගුණාත්මක යෙදවුම්

ඇමුණුම 01

බුදු දහමින් ලද දායාද ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආගමික | සමාජීය | ආර්ථික | ලේඛන කලාව හා සාහිත්‍යය |
|---|---|---|---|
| | | | |

## 6.5.3 දුටුගැමුණු රජතුමා

**නිපුණතාව**

- අතීත ශ්‍රී ලාංකික රජවරුන්ගේ චරිතාපදාන හා ජාතික සේවාව අගයමින් ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය විමසා බලයි

**නිපුණතා මට්ටම**

5.3.1 දුටුගැමුණු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 04**

**ඉගෙනුම් පල**

- එළාර යහපත් රජතුමකු බව පෙන්වා දෙයි
- කාවන්තිස්ස රජතුමාගේ ක්‍රියාකලාපය විස්තර කරයි
- දුටුගැමුණු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

5.3. දුටුගැමුණු රජතුමා

- ළමා කාලය
  - ★ දෙමාපියන්
  - ★ ළමා කාලය සම්බන්ධ කථා පුවත්
- එළාර රජතුමා
  - මහාවංශයෙහි එළාර රජතුමා දැහැමි අයෙකු බව පෙන්වා දීම
    - ★ නීතිගරුක වීම හා ජනහිතකාමී බව
    - ★ පෙර සිරිතට අනුව කටයුතු කිරීම
- කාවන්තිස්ස රජතුමා
  - සමකාලීන අභියෝග ජය ගැනීමට කාවන්තිස්ස රජතුමා ගත් පියවර
    - ★ සේනා සංවිධානය
    - ★ රුහුණ එක්සත් කිරීම
    - ★ ආර්ථික සමෘද්ධිය ඇති කිරීම
    - ★ කාලය එනතුරු බලා සිටීම
- දුටුගැමුණු රජතුමා රට එක්සේසත් කිරීම
  - ★ විදේශ ආධිපත්‍යයෙන් රට නිදහස් කර ගැනීම ප්‍රධාන අරමුණ විය
  - ★ සේනා සංවිධානය කර යුද්ධය මෙහෙය වීම
  - ★ යුද්ධය ජය ගැනීම හා දිවයින එක්සේසත් කිරීම

**ගුණාත්මක යෙදවුම්**

සැලසුම් කරන ලද පාඩමට අදාළ ව අවශ්‍ය ද්‍රව්‍ය සකස් කර ගන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාඩමට අදාළ ව ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස්කර ලකුණු පවරන්න

**නිපුණතා මට්ටම**

5.3.2 දුටුගැමුණු රජතුමාගෙන් ඉටු වූ සාසනික සේවය අගයමින් යහපත් ගුණාංග චරිතායනය කර ගනියි

**කාලච්ඡේද සංඛ්‍යාව: 01**

**ඉගෙනුම් පල**

- දුටුගැමුණු රජතුමාගෙන් ඉටු වූ සාසනික සේවය විස්තර කරයි
- වර්තමාන යහපත් ජන සමාජයක් සඳහා යොදා ගත හැකි අතීත ආදර්ශ පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න.

5.3.2 වෙහෙර විහාර කරවීම

- දුටුගැමුණු රජු බුදු දහම සඳහා කළ සේවය

★ වෙහෙර විහාර ඉදිකිරීම
(මිරිසවැටිය, ලෝවාමහාපාය, රුවන්වැලිසෑය)
★ වෙසක් පෝදින උත්සව පැවැත්වීම
★ දුටුගැමුණු චරිතයෙන් ගතහැකි ආදර්ශ විස්තර කරන්න

**ගුණාත්මක යෙදවුම්**

සැලසුම් කරන ලද පාඩමට අදාළ ව අවශ්‍ය ද්‍රව්‍ය සකස් කර ගන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාඩමට අදාළ ව ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස්කර ලකුණු පවරන්න

## 6.5.4 වළගම්බා රජතුමා

**නිපුණතාව**

- අතීත ශ්‍රී ලාංකික රජවරුන්ගේ චරිතාපදාන හා ජාතික සේවාව අගයමින් ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය විමසා බලයි

**නිපුණතා මට්ටම**

5.4.1 වළගම්බා රජුගේ ශ්‍රේෂ්ඨත්වය අගයමින් එහි ආදර්ශ චරිතායනයකර ගනියි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ** 03

**ඉගෙනුම් පල**

- වළගම්බා රජතුමා රාජ්‍යත්වයට පත් වූ ආකාරය පැහැදිලි කරයි
- වළගම්බා රජුගේ සාසනික සේවාව විස්තර කරයි
- වළගම්බා චරිතයෙන් ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

5.4. වළගම්බා රජතුමා

- සද්ධාතිස්ස රජතුමාගේ බාල පුත්‍රයා
  - ළමාකාලය සම්බන්ධ කථා පුවත්
- රාජ්‍යත්වයට පත් වීම
- වළගම්බා රජතුමාගේ සාසනික සේවාව
- අභයගිරිය කරවීම
  - ★ අභයගිරි ස්ථූපය ඉදිකිරීම
  - ★ ලංකාවේ ප්‍රථම විශාලතම ස්ථූපය වීම
  - ★ කුපික්කලතිස්ස තෙරුන්ට අභයගිරිය කරවා පූජා කරවීම
  - ★ පසුකාලීන ව අභයගිරිය විහාර සංකීර්ණය කේන්ද්‍ර කොට අන්තර්ජාතික අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත්වීම
  - ★ ඉදිකළ වෙනත් වෙහෙර විහාර
- ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
  - ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට බලපෑ හේතු විස්තර කිරීම
    - ★ වසර 14ක් පුරා පැවති බැමිණිතියා සාය
    - ★ ත්‍රිපිටක ධර්මය කටපාඩමින් පවත්වාගෙන ආ භික්ෂූන් වහන්සේලා රට හැරයාම හා විශාල පිරිසක් මිය යාම
    - ★ ත්‍රිපිටක ධර්මය මුඛපරම්පරාවෙන් රැගෙන ආ සම්ප්‍රදාය අභාවයට යාම වැළැක්වීමට මාතලේ අළුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

**මූලික වදන් / සංකල්ප**

මුඛපරම්පරාව : පරම්පරාවෙන් පරම්පරාවට කටපාඩමින් ගෙනඒම

බැමිණිතියා සාය : සාගතයකි. මෙය වසර 14 ක් පමණ පැවතුණි.

**ගුණාත්මක යෙදවුම්**

සැලසුම් කරන ලද පාඩමට අදාළ ව අවශ්‍ය ද්‍රව්‍ය සකස් කර ගන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාඩමට අදාළ ව ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස්කර ලකුණු පවරන්න

## 6.5.5 වසභ රජතුමා

**නිපුණතාව**

- අතීත ශ්‍රී ලාංකික රජවරුන්ගේ චරිතාපදාන හා ජාතික සේවාව අගයමින් ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය විමසා බලයි

**නිපුණතා මට්ටම**

5.5 • වසභ රජතුමාගේ කාර්ය සාපල්‍යය විස්තර කරයි

**කාලච්ඡේද සංඛ්‍යාවː 03**

**ඉගෙනුම් පල**

- වසභ රජතුමා රාජ්‍යත්වයට පත් වූ අයුරු පෙන්වා දෙයි
- වසභ රජතුමාගේ පාලන විස්තර කරයි
- ආර්ථික සේවාව පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න.

**5.5 වසභ රජතුමා**

- ලම්බකර්ණ රාජවංශයේ ආරම්භකයා වීම
- රාජ්‍යත්වයට පත්වීම
    - ★ අභියෝගවලට මුහුණ දෙමින් රාජ්‍යත්වයට පත්වීම
    - ★ මුළු රටේ ම ඒක කේන්ද්‍රීය පාලනයක් ඇති කිරීම
    - ★ පළාත් බෙදීම
- ආර්ථික සේවය
    - ★ පැවති ග්‍රාමීය වැව් පද්ධති විශාල කිරීම
    - ★ වැව් (මධ්‍යපරිමාණ වැව්) , ඇළ මාර්ග (යෝධ ඇළ), උමං ජලමාර්ග,
    - ★ වාරි පද්ධති ජාලයක් ගොඩනැගීම
    - ★ බදු අයකිරීම

**ගුණාත්මක යෙදවුම්**

සැලසුම් කරන ලද පාඩමට අදාළ ව අවශ්‍ය ද්‍රව්‍ය සකස් කර ගන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාඩමට අදාළ ව ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස්කර ලකුණු පවරන්න

## 6. 5.6 මහසෙන් රජතුමා

**නිපුණතා මට්ටම**

5.6 මහසේන් රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය මතුකර දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 03**

**ඉගෙනුම් පල**

- මහසෙන් රජතුමාගේ වාරි සේවාව විස්තර කරයි
- මහසෙන් රජතුමාගේ ඉදිකිරීම් ශිල්පීය දක්ෂතාවය පෙන්වා දෙයි
- මහසෙන් රජතුමාගේ ආගමික සේවාව පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

**5.6 මහසෙන් රජතුමා**

- රාජ්‍යත්වයට පත්වීම
    - ආර්ථික සේවාව
- මහා පරිමාණ වැව් සෑදීම
    - ★ මින්නේරිය වැව අතුලු වැව් ගණනාවක් ඉදිකිරීම
        - ඇළහැර ඇළ සැකසීම
    - ★ උතුරු දෙස පිහිටි කුඹුරුවලට ජලය ගෙනයාම
    - ★ වැව් සඳහා ජලය ගෙනයාම
    - ★ භාණ්ඩ ප්‍රවාහනයට හා ගමනාගමනයට ඇළ යොදා ගැනීම

- වාරි කර්මාන්තයට කළ සේවාව නිසා පසු කාලීන ව ජනතාව රජතුමා දේවත්වයට නගා පුද පූජා පැවැත්වීම
- මහසෙන් රජතුමාගෙන් සිදු වූ සාසනික සේවය පහත සඳහන් කරුණු ඇසුරින් විස්තර කරන්න
    - ජේතවනාරාමය ඉදිකිරීම
        - ★ මහාවිහාරය සීමාව තුළ ජේතවනාරාමය ඉදිකිරීම
        - ★ පුරාණ ලෝකයේ, ආසියාවේ විශාලත ම ගඩොල් ගොඩනැගිල්ල වීම
        - ★ මීට අමතර ව විහාර දහයක් ඉදිකිරීම
          උදා:- මින්නේරිය, ගෝකණ්ණ හා කලන්දක යන විහාර ඉන් කිහිපයකි.
        - ★ මහසෙන් රජු හා සම්බන්ධ ජනකථා
          ඇමුණුම අංක 01, 02 හා 03 යොදා ගනිමින් මහසෙන් රජතුමාගේ තොරතුරු ඇතුලත් හැකුළුම් පතක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න
- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුම 02 හි හැකුලුම් පත සැකසීම පිළිබඳ උපදෙස් ඇත.

**ඇගයීම හා තක්සේරුව සඳහා උපදෙස්**


පහත සඳහන් කරුණු ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සකස් කරන්න

- මහසෙන් රජතුමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- මහසෙන් රජතුමාගෙන් දේශයට වූ සේවාව අගය කරයි
- මහසෙන් රජු පිළිබඳ තොරතුරු ඇතුළත් හැකුළුම් පතක් සකසයි
- කණ්ඩායම තුළ සහයෝගයෙන් කටයුතු කරයි
- හැකුළුම් පත නිර්මාණශීලී ව සකසයි

**ගුණාත්මක යෙදවුම්**

- A 4 ප්‍රමාණයේ කඩදාසි තුනක්
- A 4 හෝ ඊට සමාන කඩදාසියක්
  (පන්තියේ සිසුන් වැඩි නම් හැකුළුම් පත් කිහිපයක් සකස් කිරීමට අවශ්‍ය ප්‍රමාණයට ද්‍රව්‍ය සපයා ගන්න)
- පෙළපොත හා මහසෙන් රජතුමා පිළිබඳ ව ඇති පොත්
- ගම්
- ප්ලැටිග්නම් හෝ පාට

**ඇමුණුම 01**



**ඇමුණුම 02**

- A 3 හෝ ඒ හා සමාන කඩදාසියක් ගෙන එය ඇමුණුම 01 රූපයේ පරිදි පැති හයක් එන පරිදි නමා හැකුළුම් පතක් සකස්කර ගන්න.
- සිසු කණ්ඩායම් නිර්මාණ එම හැකුළුම් පතේ අදාළ පිටුවල අලවන්න.

**කණ්ඩායම 01**

- "මහසෙන් රජතුමා ඉදිකළ වැව්" මාතෘකාව යටතේ කරුණු ගොනු කරන්න.
- එම කරුණු A 4 කොළය දෙකට නවා (කොළ භාගයක) තනි පැත්තක පමණක් පැහැදිලි අත් අකුරින් ලියන්න
- හැකිනම් අදාළ චිත්‍ර හෝ පින්තූර යොදා නිර්මාණය අලංකාර කර ගන්න
- සකසාගත් තීරුව හැකුළුම් පතේ දෙවන පිටුවේ අලවන්න

**කණ්ඩායම 02**

- "මහසෙන් රජතුමා කර වූ ඇළ මාර්ග හා එහි ප්‍රයෝජන" මාතෘකාව යටතේ කරුණු ගොනු කරන්න
- එම කරුණු A 4 කොළය දෙකට නවා (කොළ භාගයක) තනි පැත්තක පමණක් පැහැදිලි අත් අකුරින් ලියන්න
- හැකිනම් අදාළ චිත්‍ර හෝ පින්තූර යොදා නිර්මාණය අලංකාර කරගන්න
- සකසාගත් තීරුව හැකුළුම් පතේ තෙවන පිටුවේ අලවන්න

**කණ්ඩායම 03**

- "මහසෙන් රජතුමාගේ ආගමික සේවාව" මාතෘකාව යටතේ කරුණු ගොනු කරන්න
- එම කරුණු A 4 කොළය දෙකට නවා (කොළ භාගයක) තනි පැත්තක පමණක් පැහැදිලි අත් අකුරින් ලියන්න
- හැකිනම් අදාළ චිත්‍ර හෝ පින්තූර යොදා නිර්මාණය අලංකාර කරගන්න
- සකසාගත් තීරුව හැකුළුම් පතේ සිව්වන පිටුවේ අලවන්න

**කණ්ඩායම 04**

- "මහසෙන් රජතුමා පිළිබඳ ව ඇති ජනකථා " මාතෘකාව යටතේ කරුණු ගොනු කරන්න
- එම කරුණු A 4 කොළය දෙකට නවා (කොළ භාගයක) තනි පැත්තක පමණක් පැහැදිලි අත් අකුරින් ලියන්න
- හැකිනම් අදාළ චිත්‍ර හෝ පින්තූර යොදා නිර්මාණය අලංකාර කර ගන්න
- සකසාගත් තීරුව හැකුළුම්පතේ පස්වන පිටුවේ අලවන්න

## 6. 5.7. ධාතුසේන රජතුමා

**නිපුණතා මට්ටම**

6.5.7 ධාතුසේන රජතුමා ඉටුකළ මෙහෙය මතුකර දක්වයි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 03**

**ඉගෙනුම් පල**

- ධාතුසේන රජතුමා රාජ්‍යත්වයට පත් වූ ආකාරය පැහැදිලි කරයි
- ධාතුසේන රාජ්‍ය සමයේ පැවති ආර්ථික කටයුතු විස්තර කරයි
- ධාතුසේන රජතුමා ගේ ආගමික සේවාව පහදයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

**5.7 ධාතුසේන රජතුමා**

- රාජ්‍යත්වයට පත්වීම
  - ★ ධාතුසේන රජු රාජ්‍යත්වයට පත්වීමට පෙර පැවති දේශපාලන අවුල් සහගත තත්වය
  - ★ වසර තිහක් පමණ පැවති විදේශ පාලනය
  - ★ විදේශ ආක්‍රමණිකයන්ගෙන් රට මුදා ගැනීම
  - ★ ප්‍රථම මෞර්ය රජුවීම
- ධාතුසේන රජතුමාගේ ආර්ථික කටයුතු පහත කරුණු ඇසුරින් විස්තර කරන්න
  - ★ ඉදිකළ වැව්
  - ★ ඇළ මාර්ග
- ධාතුසේන රජතුමාගේ ආගමික කටයුතු පහත සඳහන් කරුණු ඇසුරින් පැහැදිළි කරන්න
  - ★ අවුකන පිලිමය කරවීම
  - ★ වෙහෙර විහාර කරවීම

**ගුණාත්මක යෙදවුම්**

සැලසුම් කරන ලද පාඩමට අදාළ ව අවශ්‍ය ද්‍රව්‍ය සකස් කර ගන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාඩමට අදාළ ව ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස්කර ලකුණු පවරන්න